# කටපාඩම් පද - 11 ශ්‍රේණිය

## බයිබල් පාඨ

1) සමිඳාණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් පරිපූර්ණය;නොකිපෙන සුලු ය, අතිශයින් කරුණාවන්තය - **ගීතාවලිය** 103:8

2) "සමිඳුන් කළ අරුම පුදුම දේ නිසා පසස් ගී ගයන්න; මුළු ලොවටම ඒ ගැන දන්වන්න - **යෙසායා** 12:5

3) මම ඔබට කියමි; ඔබ පේදුරු ය, මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනඟන්නෙමි, පාතාලයේ දොරටුවලට වුවද, එය පරාජය නොකළ හැකිය - **මතෙව්** 16:18

4) ශාන්තිය ඔබ වෙත ප්‍රදානය කර යමි; මාගේ ශාන්තිය ඔබට දෙමි, මා එය ඔබට දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. ඔබේ සිත් කැළඹෙන්නට වත් බිය වන්නට වත් ඉඩ නොදෙන්න - **ජොහාන්** 14:27

5) තා සහ ස්ත්‍රිය අතරද තගේ වංශය සහ ඇගේ වංශය අතරද බද්ධ වෛරය තබන්නෙමි. ඔහු තගේ හිස පොඩි කරන්නේය; තෝද ඔහුගේ විලුඹ දෂ්ට නරන්නෙහිය - **උත්පත්ති** 3:15

6) නුඹට ආසිරි පතන අයට මමත් ආසිරි පතමි. නුඹට දෙස් තබන අයට මමත් දෙස් තබමි, නුඹ මගෙන් ආසිරි ගත් අයුරින් මිහි මත සව් සත ආසිරි ලබනු ඇතැයි - **උත්පත්ති** 12:3

7) නුඹලා මට පුජක රාජ්‍යයක්ද කැප වු ජාතියක්ද වන්නහුය - **නික්මයාම** 19:6

8) උන් වහන්සේගේ මුද්‍රාව අප පිට තබා, අපගේ සිත් තුළ, අපට අත්තිකාරමක් වශයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවා වදාළ සේක - **2 කොරින්ති** 1:22

## නිසියානු විශ්වාස ලක්ෂණය

9) පියාණන් වහන්සේගෙන් හා පුත්‍රයාණන් වහන්සේගෙන් නික්මෙන සමිඳාණන් ද ජීවදායකයාණන් ද වූ ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි ද විශ්වාස කරමි. ඔවුන් වහන්සේ පියාණන් ද පුත්‍රයාණන් ද සමඟ එකම වන්දනාවත් මහිමයත් ලබන සේක. ඔවුන් වහන්සේ දිවැසිවරුන් මඟින් කථා කළ සේක - **8 වගන්තිය**

10) අපෝස්තුළුවරුන් ගෙන් පැවත එන එකම ශුද්ධ වූ කතෝලික සභාව කෙරෙහි ද විශ්වාස කරමි - **9 වගන්තිය**